# ග්‍රාමීය සමාජ ආර්ථික සංවර්ධනය සඳහා ළිං ඉදිකිරීම පිළිබඳ එක් අත්දැකීමක්

*ආර්. ද. එස්. ආරියබන්දු*

පර්යේෂණ හා පුහුණුකිරීමේ නිළධාරී ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

**දිනෙන් දින වැඩිවන ජනගහණයත් සමග ලංකාව ඇතුළුව සංවර්ධනය වන රටවල් බොහෝමයක් අවධානයයොමු කර ඇති ඉතා වැදගත්කරුණුදෙකක් නම් වගාවන් සඳහා අවශ්‍ය ජලය මද බව සහ බීමට සහ වෙනත් ගෙදරදොර කාර්යයන් සඳහා අවශ්‍ය ජලය ලබා ගැනීමට ඇති අපහසුතාවයයි.**

මෙම ගැටළු දෙකට විසඳුමක් සෙවීමේ අභිලාෂයෙන් දකුණු ආසියාවේ රටවල් හතක්, බංගලිදේශයේ "ස්ර්ඩැප්" නොහොත්ආසියා හා ශාන්තිකර කලාපයේ ග්‍රාම සංවර්ධනය පිළිබඳ මූලස්ථානය අනුග්‍රහයෙන් වෙන වෙනම ඒ ඒ ඒ රටවල් තුළ පර්යේෂණ ආරම්භ කරන ලදී. ලංකාවේ මෙම පර්යේෂණ ඉටුකිරීම ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයට පැවරුනි. මෙම පර්යේෂණ ව්‍යාපෘතිය දියත් කිරීම සඳහා ගො.ප.පු. ආයතනය විසින් නිකවැරටිය ප්‍රදේශයේ, කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඔට්ටුකුලම නමැති ගම තෝරා ගන්නා ලදී.

ඉතා දිළිඳු ගමක් වන ඔට්ටුකුලමේ වැසියන් සියල්ලෝම ජනසවිලාභීන් විය. මෙහි ජනගහණය 398ක් වුනු අතර, එය පවුල් 83 කි. ගමට ඇති එකම ස්වාභාවික සම්පත වූයේ, එහි ඇති කුඩා ග්‍රාමීය වැවයි. එම වැවයටතේ වගාකළ හැකිවූයේ අක්කර 12 ක් වැනි සුළු බිම්ප්‍රමාණයක්වූ අතර, එය ද කළ හැකි වූයේ මහ කන්නයේදී පමණි.

වැසිකිලි පහසුකම් නොතිබුණු මෙම ගමේ බීමසඳහා ජලය ලබාගත්තේ පොදු ළිං දෙකකින් සහ එක නළ ළිඳකිනි. කාලයක් ගත වූ විට එක පොදු ළිඳකින් සහ නළ ළිඳෙන් බීමට පාවිච්චි කිරීමට නොහැකි මට්ටමකට කිවුල් ගතියක් ඇතිවිය. ඉතිරිව තිබූ පොදු ළිඳේ ජලය ද තද ඉඩෝර කාලයේ දී බොහෝ විට සිඳී ගියේ ය. නියං සමයේ දී ඔට්ටුකුලම ගම්මුන්ට ඉතිරි වූ එකම ජල ප්‍රභවය වූයේ ගමේ කුඩා වැවේ තැන තැන පල්වෙමින් ඉතිරිව තිබූ කුඩා දිය කඩිතිය. සාමාන්‍යයෙන් යල් කන්නයේදී ඔට්ටුකුලම ගම්මුන් වාරි ජලයෙන් වගාවන් නොකළ අතර, යල් කන්නයේ දී ලැබෙන ඉතා අල්ප වර්ෂාවෙන් සුළු එළවළු ගොවිතැනක් හෝ හැකි අවස්ථාවන් වල දී හේන් ගොවිතැන් ද කළහ. යල්කන්නයේ දී ගම්මුන්ගේ මූලික ආදයම් මාර්ගය වූයේ කුලී වැඩය. බොහෝ දෙනෙකු මෙම කාලයේදී පහළ ඔට්ටුකුලම මුස්ලිම් ගම්මානයේ තිබෙන උළු පෝරණුවේ කුලී වැඩ කර එදිනෙද වියදමට සුළු මුදල් ප්‍රමාණයක් උපයා ගත්හ.

ගො.ප.පු.ආයතනය මෙම ව්‍යාපෘතිය දියත් කිරීමට ඔට්ටුකුලම තෝරා ගන්නා විට පැවතුනේ එවැනි තත්ත්වයකි. ව්‍යාපෘතියේ මුල්ම අරමුණවූයේ ගමට අවශ්‍ය කරන මූලික සම්පත් හඳුනා ගැනීම ය. මේ සඳහා පැවැත් වූ රැස්වීම් මාලාවකට පසු ගමට තිබෙන මූලික අපහසුතාවය වන ජල හිඟය මඟහරවා ගැනීම සඳහා වගා ළිං ඉදිකිරීමට තීරණය විය. මේ අනුව ව්‍යාප්තිය සතුව තිබූ සම්පත් ප්‍රමාණය අනුව වගා ළිං පහක් ඉදිකිරීමට සැලසුම් කරන ලදී. එමෙන් ම එක වගා ළිඳකට පස්දෙනා බැගින් කණ්ඩායම් පහක් තෝරා ගැනීමට ද තීරණය කළත්, ගමට අවතීරණය වී මාස හයක් ගත වුව ද මෙම කණ්ඩායම් පහ තෝරා ගැනීමට ගම්මුන් අපොහොසත්වූහ. අවසානයේදී කණ්ඩායම් දෙකක් පමණක් මේ සඳහා ඉදිරිපත් විය.

කෙසේ හෝ ඉදිරිපත් වූ කණ්ඩායම් දෙක සමග මෙම ව්‍යාපෘතිය දියත් කිරීම 1991 සැප්තැම්බර් මාසයේ ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතියේ මූලික න්‍යාය වූයේ ග්‍රාමීය ජනතාව අතරින් ග්‍රාමීය ජනතාව සඳහා එහි ප්‍රතිලාභීන්ගේ සහභාගීත්වයෙන් කළ යුතු ය යන්න ය. එහෙයින් මෙම ව්‍යාපෘතිය යටතේ කුලී වැඩසඳහා ගෙවීම් කිරීම ද, යන්ත්‍රෝපකරණ භාවිතය ද මූලික සංකල්පයට සම්පූර්ණයෙන් පටහැනිවිය. මෙය පිළිගත් ගොවි කණ්ඩායම් දෙක, ළිං කැපීම සැප්තැම්බර් මාසයේ ආරම්භ කරන ලද්දේ, 1991/92 මහ වැසි ලැබීමට පෙර අවසාන කරන අරමුණෙනි. කෙසේ හෝ 1991/92 මහ වැසි ආරම්භ කරන අවස්ථාව වන විටත්, ළිං දෙක හාරා අවසාන කොට නොතිබුණි. මහ කන්නයේ මහ වැසි පවතින අවස්ථාවේ එක ළිඳක, ළිං බැමි කඩාගෙන වැටුන අතර, මහවැසි අවසාන වී නැවත වැඩ ආරම්භ කලේ එක් කණ්ඩායමක් පමණි. අනෙක් කණ්ඩයම ළිඳ නැවත ගොඩ දැමීමට "ඩෝසර්" යන්ත්‍රයක් අවශ්‍ය යයි කියා සිටියේ පොරොන්දු වූ මූලික සංකල්ප අමතකකර දමමිනි. රාජ්‍ය ග්‍රාම සංවර්ධන ක්‍රියාදමයසහ එහි ප්‍රතිළාභ වරදවා වටහාගත් මෙම ගොවි කණ්ඩායම, තම ළිඳ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා නිරන්තරයෙන් ම පිටස්තර ආධාර පැතී ය.

ඉතිරිව තිබූ අනෙක් ළිඳ තැනීමේ යෙදී සිටි ගොවි කණ්ඩායමට ද නොයෙක් විට බාධක වලට මුහුණදීමට සිදු විය. මෙම ළිඳ සාදන ස්ථානයේ කුඹුරු යාය අසල හෙයින්, ළිඳ කපන අවස්ථාවේදී ඉතා විශාල ජල ප්‍රමාණයක් ඉවතට දැමීමට හේතුවිය. මේ අනුව ඒ සඳහා විශාල මුදලක් වැය වූ අතර ළිඳ බැඳීමේ කටයුතු ද මේ නිසා ප්‍රමාද විය.

## වගා ළිං ඉදිකිරීම

කවය අඩි 17-18 ක් ද, ගැඹුර අඩි 17-20 ක් වූ මෙම වගා ළිං දෙක ඉදිකිරීම සඳහා දළවශයෙන් එකකට රු. 23,000 ක් පමණ අවශ්‍ය විය. මීට අමතරව අහල් දෙකේ වතුර පොම්පය එහි උපාංග සහ ඇල්කතීන් බට අඩි 60 සඳහා රු. 21,000 ක් පමණ අවශ්‍ය විය. වතුර පොම්ප දෙක ගො.ප.පු.ආයතනය මගින් ගෙන ගොස් දුන් අතර,ළිං දෙක සෑදීමට අවශ්‍ය වැලි,ගල්, සිමෙන්ති ආදිය ගැනීම සඳහා අවශ්‍ය රු. 40,000 ක ප්‍රමාණයක් ගොවි සංවිධානයේ බැංකු ගිණුමට බැර කරන ලදී. බැංකු ගිණුමකට බැර කිරීමේ මූලික අදහස වූයේ ගොවීන්ට අවශ්‍ය වේලාවකට අවශ්‍ය ප්‍රමාණයක් ගැනීමට අවස්ථාව සැලස්වීම සහ එම මුදල් ගනුදෙනු වලට අනවශ්‍ය ලෙස නිලධාරී මැදිහත් වීම අඩුකිරීමයි. මෙසේ ළිං දෙක ඉදිකරන කිහිප අවස්ථාවකදීම ගොවි කණ්ඩායම් අවශ්‍ය නොයෙක් භාණ්ඩ ගෙන්වන ලද නමුත් එසේ ගෙන්වීමේදී අප බලාපොරොත්තු වූ පරිදි ගොවීන්ගේ

මැදිහත්වීමෙන් පමණක් එය සිදු නොවිනි. සෑම අවස්ථාවක දී ම ගොවීන් බැංකුවෙන් මුදල් ගෙන එය ගමේ වැඩ කළ නිලධාරියෙකුට භාර දී ඔහු මාර්ගයෙන් ඉදිකිරීමේ ද්‍රව්‍ය ගෙන්වා ගැනීමට පුරුදු වී සිටිය හ. මෙහිදී මතුවන මූලික කරුණක් නම් මෙවැනි කුඩා වැව් ආශ්‍රිත බොහෝ ගොවීන් තවමත් තම ගමේ පිළිගත් පුද්ගලයන් ගැන තිබෙන විශ්වාසය හා රාජ්‍ය නිලධාරීන් මත තිබෙන යැපීම නොබිඳී ඇති බවයි. මෙවැනි අවස්ථාවල දී ගොවීන් විසින් තමන්ව අවතක්සේරු කර ගැනීමකට පුරුදුව සිටිම අවාසනාවකි. මෙම ක්‍රියාදමයේ අවසාන ප්‍රතිඵලය වූයේ එක් එක් අවස්ථාවල දී ඉදිකිරීම් ද්‍රව්‍ය ලබාගැනීමේ දී ඇති වූ ප්‍රමාද දෝෂයක් නම් එක් නිලධාරියකු අතින් මෙම මුදල් වෙන කටයුත්තක් සඳහා වියදම් වී එය නැවත, ලබාගැනීමේ දී ඇති වූ ප්‍රමාද දෝෂය ය. මීට අමතරව ළිඳ ඉදිකිරීමේ දී ගොවීන්ගේ නොයෙක් අවශ්‍යතාවයන් සඳහා ඉදිකිරීමේ කටයුතු එක දිගටම කරගෙන යෑමට නොහැකිවිය. මෙවැනි හේතූන් නිසා සාමාන්‍යයෙන් මිනිස් දින 150ක් පමණගත වන කාර්යය සඳහා මිනිස් දින 270-290 පමණ ළිං ඉදිකිරීමට ගතවිය. ගත වූ මුළු කාලය වශයෙන් බැලුවොත් මෙම ළිං දෙක සියල්ල සම්පූර්ණ කොට නිම කිරීම සඳහා මාස 10 ක පමණ කාලයක් වැය වී තිබුණි.

මෙවැනි ළිඳක් "ඩෝසර්" යන්ත්‍රයෙන් කැපීම සඳහා අවශ්‍ය වන්නේ පැය 08ක් වැනි සුළු කාලයක් වුව ද, ඒ සඳහා දළ වශයෙන් රු. 10,000 ක් පමණ ගෙවීමට සිදු වේ. මෙසේ ඉතා දීර්ඝ කාලයක් තුළ තමන්ගේ වෙනත් නොයෙක් කර්තව්‍යයන් අතපසු කොට මෙසේ ළිං සෑදීමෙන් පසු එය සැළකුනේ ගමට ලැබුණු පොදු සම්පතක් ලෙස නොව තමන්ගේ පුද්ගලික බුදලයක්ලෙසය. මෙම ළිං දෙකේ ගොවීන් කිසිම අවස්ථාවක එකිනෙකාට උදව් නොකිරීමත්, ළිඳට සම්බන්ධ වූ අය හැර වෙනත් කිසිම කෙනෙකුට මෙම ළිං වලින් ගොවිතැනට ජලය ලබාගැනීමට ඉඩ නොදීමත් ඒ සඳහා දක්නට ලැබෙන හොඳම උදාහරණයන් ය.

## වගා ළිං වලින් ලැබෙන ප්‍රතිලාභ

සෑම අවුරුද්දකම යල් කන්නයට පානීය ජලයවත් ලබාගත නොහැකිවූ ඔට්ටුකුලම ගම්මානයට දැන් ඉඩෝරයට නොසිඳෙන කුඩා පොකුණු දෙකක් මෙන් වගා ළිං දෙකක් ලැබී ඇත. කණ්ඩායමට අයිති ගොවීන්ට හැර අනෙක් අයට මෙම ළිං වලින් වගාවන් සඳහා ජලය ලබා ගැනීමට නොහැකි වුවත්, මුළු ගමට සහ ගමෙන් පිටස්තර අයට ද බීමට සහ නෑමට මෙම ළිං ජලය ලබා ගැනීමට පුළුවන. පසුගිය ඉඩෝර කාලයේ දී මෙම ළිං වලට මාවතගම වැනි සැතපුම් 5-6 දුරසිට ද බොහෝ දෙනා නෑමට සහ බීමට ජලය ලබාගැනීමට පැමිණ ඇත

මෙම වගා ළිං දෙක සම්පූර්ණයෙන්ම සාද අවසානවූයේ 1992/93 මාස් කන්නය ආරම්භයේ දීය. එම නිසා ළිං වල සම්පූර්ණ ප්‍රතිලාභ ලබෙන්නට පටන්ගනුයේ 1993 යලකන්නයේ දී ය. කෙසේ හෝ මෙම ළිං නිසා එක් ගොවි කණ්ඩායමක් තමන් සතු කුඹුරු ඉඩම් අක්කර පහක ප්‍රමාණයකට 92/93 මාස් කන්නයේ අවසානයේ අවශ්‍ය ජල මුර දෙක ලබාගැනීමෙන් කුඹුරු පාලුවීම වලක්වා ගත හැකි විය. මෙම යල් කන්නයේදී ළිං දෙක ආශ්‍රයෙන් ඉඩම් අක්කර 4 ක පමණ ප්‍රමාණයක් මිරිස් සහ එළවළු වගාකිරීමට මෙම ගොවි කණ්ඩායම් දෙක බලාපොරොත්තු වේ, ළිං ආශ්‍රයෙන් කිරීමට බලාපොරොත්තු වන වගාවට අමතරව එක් කණ්ඩාමක් තමන්ගේ ළිඳට තිලාපියා පැටව් 29 දෙනෙකු දමා ඇත. ඉතා සීඝ්‍රව බෝවන මේ මත්ස්‍ය වර්ගය ඉතා සුළු කාලයකදී මත්ස්‍ය සංඛ්‍යාව දෙගුණ තෙගුණ කරගැනීමට ඉඩ ඇත. එවිට මෙම ගොවීන්ට තමන්ගේ ආහාර වේලට අවශ්‍ය උපරිම ප්‍රෝටීන් ප්‍රමාණය මෙයින් ලබාගත හැකි වන අතර, මෙම තිලාපියා මාළු අලෙවිකර තමන්ට යම් ආදායමක් ලබා ගැනීමට ද හැකිවනු ඇත.

## නිගමනය :

බංගලිදේශයේ "ස්ර්ඩැප්" ආයතනය බලාපොරොත්තු වූ ආකාරයට ලංකාවේ මෙම ව්‍යාපෘතියේ ද අපේක්ෂා කලේ වගාවට සහ බීමට ජලය යන කරුණුදෙකම මූලික කොටගත් පාදක ව්‍යුහයක් ඉදි කිරීමයි. නමුත් එය එසේ කිරීමේ දී අප බලාපොරොත්තුවූ ආකාරයට ළිං ඉදිකිරීමට ගම්මුන්ගේ සහයෝගය නොලැබුණි. සමහර අවස්ථාවල දී ළිං ප්‍රතිළාභීන් ද තමන්ගේ ළිඳේ වැඩ කිරීමට දෛනික කුලියක් ඉල්ලා සිටි අවස්ථා ද විය. මෙය අප දකින්නේ අද ලංකාවේ පවතින ආර්ථික තත්ත්වයට හැඩ ගැස්වීමක් විනා මුදල්වලට දක්වන ඇල්මක් නොවේ. මෙම ළිං වලින් ලැබෙන ප්‍රතිලාභ හේතුවෙන්, මෙවැනි ළිං ඉදිකිරීමට ගමේ වෙනත් කණ්ඩායම් ඉදිරිපත් වේ යයි අප බලාපොරොත්තු වීමු. එවිට දැනට 75% ක් පමණ ආධාර ලැබුනු මෙම කණ්ඩායම් දෙකේ ගොවීන් අනෙක් අයට, අඩු තරමින් ළිඳ ඉදිකිරීමට අවශ්‍ය ළිං ගඩොල් සාද ගැනීමටවත් උපකාර වනු ඇතැයි ද අප අපේක්ෂා කළෙමු. දැනට මෙවැනි තත්ත්වයක් උද වී නැත. එය එසේ වුවහොත් මෙම ළිං ලාභී කණ්ඩායම් දෙකේ එක්කෙනෙකුවත් ඇත්තෙන්ම උදව් කිරීමට ඉදිරිපත් වේ යයි බලපොරොත්තු විය නොහැක. සාම්ප්‍රදයික ගැමි සාරධර්ම අභාවයට යමින් පවතින වර්තමානයේ ගමේ පොදු යහපත අමතක කොට තමන්ගේ පුද්ගලික දියුණුව ගැන සැළකිලිමත් වීමට නාගරික මෙන්ම බොහෝ ගම්මුන්ද දැන් පුරුදු වී තිබේ.